කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2016

2022 දෙසැම්බර් - 2023 මාර්තු

මානවශාස්ත්‍ර පීඨය

සිංහල (පැරණි නිර්දේශය)

සිංහල ගද්‍ය සාහිත්‍යය, නාට්‍ය හා සිනමාව SINH – E 2015

එක් කොටසකින් එක් ප්‍රශ්නය බැගින්වත් තෝරාගෙන
ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි. | කාලය : පැය 03 යි.

## 1 කොටස

01. පහත සඳහන් ඡේදය ලිහිල් බසින් ලියා කතුවරයාගේ අවස්ථා නිරූපණ කුසලතාව අගයන්න.

ස්වාමිදරුවානෝ සන්ධ්‍යාවලාපටලයෙකින් විදුලියක් ඇදැ ගන්නා සේ, තමන් පෙරෙ රන්සිවුර යටින් රන්වන් ශ්‍රී හස්තය ඇදැ ගෙණැ දික් කොට "මහණෙනි, මෙසේ එව"යි යෙත් ල. වදාළ බස හා සමඟමැ ඉන්ද්‍රජාලයෙක්හි රුවක් පෙණී ගියා සේ අංගුලිමාලයන් ඇඟැ මහණරුව පෙණී ගියේ. කෙසේ වූ සන්හුන්කමෙක් ද? කෙසේවූ විනීතකමෙක් ද? ස්වාමිදරුවෝ තමන් වහන්සේගේ පාත්‍රචීවර උන් අතට දීලා තුමූ පළමු වැ ගෙණැ උන් පසු කොට ලා, අළුතැ පියාසර උගන්නා ගරුඬපෝතකයා පස්සෙහි ලාගෙණැ අහස්හි නික්මුනු ළෙසියක් යොදුන් ගරුඬරාජයා සේ, සිංහපොතකයක්හු පස්සෙහි ලාගෙණැ නික්මුනු කෙසරසිංහරාජයක්හු සේ ඇත්පොව්වකු පස්සෙහි ලාගෙණැ නික්මුනු මදයෙන් මනොඥ වූ ගමන් ඇති ෂඩ්දන්ත හස්තිරාජයා සේ, පස්සෙහි ගල්වතට පළමු වැ නික්මුනු සත්රුවන් මහනැවක් සේ සිතු සිත මස්තකප්‍රාප්ත කොට ගෙණැ ජේතවන විහාරයට වැඩැ ක්‍රමයෙන් ඔවුන් රහත් කොට ඔවුන් බිණූ පිරිතින් පස්වාදහසක් මුළුල්ලෙහි කෙළලක්‍ෂයක් සක්වළට ආඥා පවත්වා සත්ත්වයන් දුකින් ගලවති. මෙසේ බණ කියා ගැලවියැ යුතු සත්ත්වයන් නිරැදුකින් ගලවා අමාමහනිවන්හි ලන සේ

02. පොළොන්නරු යුගය බණ කතා සාහිත්‍යයේ ආරම්භක අවදිය ලෙස සැලකීම කොතෙක් දුරට යුක්ති යුක්ත දැයි සනිදර්ශනාත්මකව සාකච්ඡා කරන්න.

03. "සද්ධර්මරත්නාවලී කතුවරයාගේ මුඛ්‍ය අරමුණ වූයේ ශ්‍රාවකයා කුසලයට යොමු කොට අකුසලයෙන් වැළකීමයි." නිදර්ශන සහිත ව පහදන්න.

## 11 කොටස

04. <u>බැද්දේගම</u> නවකතාවෙහි නිරූපිත අධිරාජ්‍යවාදී පාලන තන්ත්‍රයේ යථා ස්වභාවය පිළිබඳ විග්‍රහයක් කරන්න.

05. <u>විලාසනියකගේ ප්‍රේමය</u> නවකතාවෙහි කථානායිකා භූමිකාව වන සාමාගේ චරිතයෙහි ගැබ්ව ඇති සංකීර්ණ ලක්ෂණ කවරේදැයි පහදන්න.

06. පහත සඳහන් කෙටිකතා අතරින් එකක් පිළිබඳ විචාරයක් සපයන්න.

අ) තිවුණු තේ කෝප්පය
ආ) නෘත්‍යාගාරය
ඇ) පටු තීරය
ඈ) උරුම කරුම

## 111 කොටස

07. කෝලම් නාට්‍ය කලාවෙහි ඇති අභිචාරාත්මක ලක්ෂණ පිළිබඳ විග්‍රහයක් කරන්න.

08. සිංහබාහු නාට්‍යයෙහි තේමාව වශයෙන් සැලකෙන පිය-පුතු ගැටුම නාට්‍යෝචිතව නිරූපිතව ඇති ආකාරය පහදන්න.

09. "අකිර කුරසොව විසින් නිර්මිත රශෝමොන් චිත්‍රපටය, මූලාශ්‍රය වූ කෙටිකතා ද්වය සමතික්‍රමණය කරන්නකි." සනිදර්ශනව විමර්ශනය කරන්න.

10. "තුංමංහන්දිය චිත්‍රපටය, එළැඹෙන ධනේශ්වර සමාජ සංස්කෘතිය අභිමුව දේශීය සාම්ප්‍රදායික හරයයන් හා පුරුෂාර්ථයන් වියැකී යන ආකාරය ප්‍රතිබිම්බනය කරයි." ප්‍රධාන භූමිකා කෙරෙහි සාවධාන ව තත් මතය විග්‍රහ කරන්න.

(සෑම පිළිතුරකට ම ලකුණු 20 බැගින් පිරිනැමේ)

**********************************